# ස්වප්න පිළිබඳ බෞද්ධ ආකල්පය

*පූජ්‍ය යෝධකණ්ඩියේ අරියවංස* [1]

'**ස්වප්න**' යන සංස්කෘත පදය '**සුපින**' යනුවෙන් පාලියටද '**සිහින**' හෝ '**හීන**' යනුවෙන් සිංහලටද පැමිණ ඇත. 'dream' යනුවෙන් ඉංග්‍රීසියේ භාවිත වන එයට ශ්‍රී සුමංගල ශබ්දකෝෂයෙහි අරුත් සපයා ඇත්තේ '**නින්දෙහිදී හිතට අරමුණු වන පෙර කළ කී දේ ආදිය**' යනුවෙනි. ඉංග්‍රීසි ශබ්දකෝෂවල 'a series of images, events and feelings that happen in your mind while you are sleeping' යනුවෙන් '**සිහින**' යන්න නිර්වචනය කොට ඇත. මේ අනුව තමන්ගේ අතීත සහ අනාගත සිදුවීම්හි නිමිති ලෙස '**නිදන්නහුට පෙනෙන මනෝමය දර්ශනයක්**' ලෙස සිහින යන්න සරලව නිර්වචනය කරගත හැකිය.

සිහින පෙනෙන්නේ නින්දේදීය (slumber). ස්වාභාවික නින්දෙහි ආරම්භක අවස්ථාව හෙවත් නිදිබර ගතියේ සිට ගැඹුරු නින්ද දක්වාත් නැවත පිබිදීම දක්වාත් අදියර පහක් (05) ඇත. එනම්; නිදිමත ගතිය (drowsiness), අඩනින්ද (light slumber), ගැඹුරු නින්ද (deep slumber), පිබිදීමය (awakening). සිහින පෙනෙන්නේ අඩනින්ද අවස්ථාවේදී හෙවත් සිව්වැනි අදියරයේදීය. මිලින්දපඤ්හයේ සුපින පඤ්හයෙහි මෙම අවස්ථාව '**කපිනිද්‍රාව**' හෙවත් '**කපිමිද්ධ**' ලෙස නම් කොට ඇත.

බුදුවරුන්ට සහ රහතන් වහන්සේලාට ස්වප්න නොපෙනේ. අන් සියල්ලන්ට ස්වප්න පෙනිය හැකිය. වාතාධික (wind) තැනැත්තා අහස් ගමනාදී සිහින දකියි. පිත්තාධික (bile) පුද්ගල තෙමේ අග්නිදාහාදි (ගින්දර හා සම්බන්ධ) ස්වප්න දක්නේය. සෙම් (phlegm) කිපුණා වූ තැනැත්තා ජල ක්‍රීඩාදි සිහින දකින්නේය. මෙලෙස ධාතු කිපීම් හේතුවෙන් (ධාතුක්ඛොභ) දක්නා සිහින සත්‍ය වූ ඒවා නොවේ. දෙවිවරුන්ගේ මැදිහත් වීමක් සහිතව (by spirits) දියුණුව හෝ පරිහානිය සම්බන්ධ (දෙවතොපසංහාර) නොයෙක් අරමුණු වශයෙන් පෙනෙන සිහින සහ පෙර පුරුදු කරන ලද කර්ම හේතු කොට (revival of past experience) (අනුභූතපුබ්බ) පෙනෙන සිහින සත්‍ය හෝ අසත්‍ය විය හැකිය. නමුත් තමාගේ අනාගත අපේක්ෂාවන්හි පූර්ව නිමිති (prophetic dreams) වශයෙන් පෙනෙන ස්වප්න සත්‍ය විය හැකිය. රෝගී වූද, ශෝකාකුල වූද, කාමයෙන් පීඩිත වූද, මත් වූද සත්ත්වයා විසින් දුටු සිහිනයෝ ඵල රහිත බැව්ද දත යුතුය.

මෙසේ පූර්ව නිමිති වශයෙන් දක්නා සිහිනවල කිසියම් සත්‍යතාවක් පවතින්නේද යන්න අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි. මේ සඳහා බෞද්ධ හා තදන්‍ය මූලාශ්‍රය මෙන්ම මේ සම්බන්ධයෙන් සිදු කරන ලද පෙරදිග හා බටහිර පර්යේෂණ වාර්තාද අදාළ කර ගැනේ.

**ප්‍රමුඛ පද :** ස්වප්න, මනස, නිද්‍රාව, බෞද්ධ මූලාශ්‍රය, පූර්ව නිමිති

[1] *පශ්චාත් උපාධි අපේක්ෂක, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව. arwansa@gmail.com*